# සත්තවතපද (දේවා) සූත්‍රය

(සං.නි. i, 406 පිට)

සංයුත්ත නිකායෙහි සක්ක සංයුත්තයෙහි ඇතුළත් මෙම සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙන සමයක දේශනා කරන ලද්දකි. සක්දෙවිඳු රජු පෙර භවයෙහි මිනිස් ලොව වෙසෙද්දී සත්වත පදවලින් සමන්විත වූ බවත් එම ගුණාංග අන් අය වෙත ද සමාදන් කරවූ බවත් එහි අනුසස් වශයෙන් සක්දෙව් පදවි ලද බවත් සඳහන් කරමින් බුදුරජාණන් වහන්සේ මෙම සූත්‍රයේ ඇතුළත් කරුණු විස්තර කළහ.

එම සත්තවත පද නම් කවරේ ද?

1. දිවිහිමියෙන් මව්පියන් පෝෂණය කරන්නෙම් වන්නෙමි.
2. දිවිහිමියෙන් කුලදෙටුවන් පුදන්නෙම් වන්නෙමි.
3. දිවිහිමියෙන් මිහිරි වදන් කියන්නෙම් වන්නෙමි.
4. දිවිහිමියෙන් කේලාම් (පිසුණු වදන්) නොකියන්නෙම් වන්නෙමි.
5. දුරු කළ මසුරු මළ ඇත්තේ අනුන් විසින් ඉල්ලන්නට සුදුසු වූයෙම්, දිවිහිමියෙන් දන්දීමෙහි ඇලුනෙම් වන්නෙමි.
6. දිවිහිමියෙන් සත්‍ය වචන ඇත්තෙම් වන්නෙමි.
7. දිවි හිමියෙන් ක්‍රෝධ නොකරන්නෙම් වන්නෙමි. ඉදින් මට ක්‍රෝධයෙන් උපදනේ ද වහා එය දුරු කරන්නෙමි.

***‘මාතාපෙත්තිභරං ජන්තුං කුලේජෙට්ඨාපචායිනං,***

***සණ්හං සඛිලසම්භාසං පේසුණෙය්‍යප්පහායිනං,***

***මච්ඡේරවිනයේ යුත්තං සච්චං කෝධාභිභුං නරං,***

***තං වේ දේවා තාවතිංසා ආහු සප්පුරිසෝ ඉතී’ති.***

### 1. මව්පියන් පෝෂණය කිරීම (*මාතාපෙත්තිභරං*) :-

තමන් හැදූ වැඩූ මව්පියන් පෝෂණය කිරීම නුවණැති සත්පුරුෂයන් විසින් අගයන ලද්දකි. තමා කොපමණ කළගුණ දන්නෙක් ද කළගුණ සලකන්නෙක් ද යන්න අන් අය විසින් මැන බලන ප්‍රධාන සාධකයක් වන්නේ මව්පියන්ට සලකන ආකාරයයි. එපමණක් නොව මෙය උතුම් පින්කමක් වන අතර පරලොව සුගතිපරායන වීමට තරම් ආනිසංස ලැබෙන පින්කමක් වශයෙන් ද මව්පියන්ට සැලකීම දක්වා තිබේ.

### 2. කුල දෙටුවන් පිදීම (*කුලේජෙට්ඨාපචායිනං*) :-

සමාජයෙහි මෙන් ම තම පවුල්වල සිටින වැඩිහිටියන් පිදීම සෑම වැදගත් සමාජයක ම අගයන ගුණාංගයකි. එමගින් අන් අයට පිනක් මෙන් ම එම වැඩිහිටියන් වෙතින් අවවාද අනුශාසනා ලැබීමට ද හේතු වන්නකි. බුදුරදුන් සමයෙහි වජ්ජීන් තුළ පැවැති අපරිහානීය ධර්මවලින් එක් කරුණක් ලෙස ද මෙය දක්වා තිබේ. නිතර වැඩිහිටියන් පිදීම ආයු, වර්ණ, සැප, බල ලැබීමට හේතුවක් ලෙස ද සඳහන් වේ.

### 3. මිහිරි වදන් පැවසීම (*සණ්හං සඛිලසම්භාසං*) :-

තමන්ටත් අනුන්ටත් මෙලොවටත් පරලොවටත් යහපත පිණිස හේතුවන වචන කථා කිරීම බුදුදහමේ සඳහන් තවත් වැදගත් ගුණාංගයකි. යම් වචනයක් කීමේ දී එය සත්‍ය ද ප්‍රිය ද අර්ථසහිත ද

යන සාධක බුදුදහමේ දී සලකා බැලේ. යමක් සත්‍ය නම් අර්ථ සහිත නම් ප්‍රිය නම් එය හැම තැන්හි දී ම පැවසේ. එය මිහිරි වදනකි. එමෙන් ම යමක් සත්‍ය නම් අර්ථ සහිත නම් ඇතැම් විට එය අප්‍රිය වුව ද පැවසීම බුදුදහමේ ලක්ෂණයයි.

**4. කේලාම් නොකීම (*පේසුණෙය්‍යප්පහාහිනං*):-**

අන් අයගේ අසමගියට හේතුවන පිසුණු බසින් වැළකී සිටීමට බුදුසමය නිතර අනුශාසනා කරයි. මෙහි දී අප කථා කිරීමේ දී නැවත නැවතත් නුවණින් සලකා බලා වචන කථා කිරීම බෙහෙවින් වැදගත් වේ. අප බොහෝ විට සමාජගත ජීවිතයේ දී අප්‍රසාදයට පත් වන්නේ අප කථා කරන වචන හේතුවෙනි. වචන යහපත් වීමට නම් සංකල්පනා යහපත් විය යුතු අතර වචන යහපත් වීමට මනා දක්මක් තිබීම අවශ්‍ය කෙරේ.

**5. මසුරුමළ දුරු කිරීම (*මච්ඡේරවිනයේ යුත්තං*) :-**

අපේ සිතට අසහනය අසතුට ඇති වීමට ප්‍රධාන කරුණක් වන්නේ දැඩි ලෝභය හෙවත් අභිජ්ඣාවයි. එය දුරුවීමට ටිකින් ටික නමුත් දන්දීමට හුරු විය යුතු ය. සමාජගත ජීවිතයේ දී අන් අයගේ අප්‍රසාදයට ලක්වීමට ද දැඩි ලෝභය හේතු වේ.

**6. සත්‍ය වචන කථා කිරීම (*සච්චං*) :-**

ඇත්ත කථා කිරීම ද දෙව්ලොව ඉපදීමට තරම් හේතුවන ගුණාංගයක් ලෙස බුදුදහමෙහි ඇගයීමට ලක් වේ. බුදුබව සඳහා පාරමිතා පුරුන බෝසත්වරු සත්‍ය කථා කිරීම පාරමිතාවක් ලෙස සම්පූර්ණ කරති. ඇතැම් විට අන් වැරදි සිදු වුව ද බොරු කීම කිසි විටෙකත් සිදු නොකරති. මෙය නිවන් අපේක්ෂාවෙන් කටයුතු කරන ඒ සඳහා පිළිවෙත් පුරන බුදු, පසේබුදු, රහත් උතුමන් දිවිහිමියෙන් සම්පූර්ණ කරන ගුණාංගයකි.

**7. ක්‍රෝධය දුරු කිරීම (*කෝධාභිභූං*) :-**

ක්‍රෝධ දුරු කිරීම හත්වැනි ලක්ෂණයයි. සිතට ක්‍රෝධයක් පැමිණි විට සිතෙහි සහනය සතුට නැති වේ. සිතෙහි ක්‍රෝධයක් ඇති විට අපට කොයි තරම් සැප සම්පත් තිබුණ ද ඒ කිසිවකින් නියම සතුටක් නොලැබේ. එම නිසා අප ලද උතුම් මිනිස් භවයෙන් මෙන් ම අප ලබා ගත් අධ්‍යාපනය, ධනය, ඥාති මිත්‍රාදි සියලු දෙයින් අප බලාපොරොත්තු වන සතුට ලැබීමට නම් සිතෙහි අන් අය කෙරෙහි ක්‍රෝධය, තරහ, ද්වේශය හැකිතාක් දුරට දුරු කළ යුතු ව ඇත. සිතෙහි සහනය සතුට අපේක්ෂා කරන්නකු විසින් සම්පූර්ණ කළ යුතු මූලික ගුණාංගයක් ලෙස මෙත් වැඩීම සඳහන් කොට තිබේ. අප කෙතෙක් දුරට මානසික සතුට කරා යනවා ද යන්න තීරණය කෙරෙන ප්‍රධාන සාධකයක් වන්නේ අප කෙතෙක් දුරට මෙත් භාවනාව පුරුදු පුහුණු කරනවා ද යන කරුණයි.

මෙකී ගුණාංග ප්‍රගුණ කළ ප්‍රමාණයට අප මෙලොව ජීවිතය සතුටින් ගත කරන අතර පරලොව වශයෙන් දෙව්ලොව ඉපදීමට ද එය හේතු වේ. ඒ අතර සමාජගත ජීවිතයේ දී මෙන් ම දෙවියන්ගේ පවා ගෞරවය, විශ්වාසය, ප්‍රසාදය දියුණු කරමින් ජීවත් වීමට ද මෙම ගුණාංග බෙහෙවින් උපාකාරී වේ. විශේෂයෙන් තමන් ඇසුරු කරන තම දූදරුවන්ට ඤාතීන්ට මෙන් ම හිතමිතුරන්ට ද එය මහත් ආදර්ශයක් මෙන් ම ආශීර්වාදයක් ද වනු ඇත. තව ද අප දෛනික ව සිදු කරන අධ්‍යාපනික, ආර්ථික කටයුතු සඵල කර ගනිමින් වඩාත් සාර්ථක ජීවිතයක් ගත කිරීමට ද මෙම යහපත් ගතිලක්ෂණය බෙහෙවින් උපකාරී වේ.